සැ. යු. - (i) 2019.01.11 දින පළ වූ අංක 2,106 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,107- 2019 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2019.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 68 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාත් සභාව

### අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ,2019 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2019 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රු. මිලියන නව දහස් අටසිය අනූ පහක් (9,895,000,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාල සීමාවක් ඉකුත් වන දිනය හෝ 2019 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

2019 වර්ෂය සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශය සහ ආදායම් වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වන භාණ්ඩාගාර ප්‍රදාන පිළිබඳ විස්තර සහ ආදායම් ඉලක්ක මේ වනතෙක් පළාත් සභාව වෙත ලැබී නොමැති බැවින් මෙම ඇස්තමේන්තුව අතුරු සම්මත ගිණුමක ස්වරූපයෙන් පිළියෙල කර ඇත. මෙම වියදම් දැරීම සඳහා ප්‍රදානයන් සහ ආදායම් ඉලක්ක භාණ්ඩාගාරය විසින් ඉදිරියේ දී ලබා දෙනු ඇතැයි අපේක්ෂාවෙන් මෙම ඇස්තමේන්තු සකස් කර ඇති බැවින් 2019 වර්ෂයේ මුල් මාස හතර තුළ භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන සඳහා වූ අග්‍රීම හා රැස්කරනු ලබන ආදායම්වල උපරිමය දක්වා පමණක් වියදම් දැරීමට මෙම අවසරය සීමා කරමි.

නිලූකා ඒකනායක,
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2018 නොවැම්බර් මස 30 වැනි දින.

### අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2019 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති දෙවන (II) උපලේඛනයේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාල සීමාවක් ඉකුත් වන දිනය හෝ 2019 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

නිලූකා ඒකනායක,
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2018 නොවැම්බර් මස 30 වැනි දින.

## සබරගමුව පළාත් සභාව

*2019.01.01 සිට 2019.04.30 දක්වා ආදායම් වියදම් ඇස්තමේන්තුව*

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමියගේ අවසරය පරිදි පළාත් සභා අරමුදලින් වියදම් දැරීම සඳහා සකස් කරන ලදී.

## සබරගමුව පළාත් සභාව

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හයවන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අවසර දීම*

2019 වර්ෂයේ ජනවාරි 01 සිට අප්‍රේල් 30 දින දක්වා මාස හතරක සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමක්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මාස හතරක් තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමක්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ කාලය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමක් සඳහා වූ නියෝගයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා වන මා විසින් මෙසේ පනවනු ලැබේ.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනයෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2019 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාලසීමාව සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රු. මිලියන නව දහස් අටසිය අනූ පහක් (රු. 9,895,000.00) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිලධාරින්ට මෙයින් අවසර දෙමි. *(අවසරය ලබා දීම.)*

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ නියෝගයෙහි ''මාස හතරක කාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 2019 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2019 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රුපියල් මිලියන නව දහස් අටසිය අනූ පහක් (රු. 9,895,000,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :- *(2019 මුල් මාස හතර සඳහා විසර්ජන.)*

*(අ)* සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින්, හා

*(ආ)* සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබා ගන්නා මුදල්වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රු. මිලියන නව දහස් අටසිය අනූ පහක් (රු.9,895,000,000) වූ මුදල මේ නියෝගයේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (I) වන උප වගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා එය වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනුලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

3. (1) 2019 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තුළ දී, මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වන තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තෙන් ගිණුමට බැර කළයුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්ථය, VI තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. *(2019 වර්ෂයේ මුල් මාස හතර සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම.)*

4. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2019 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන, වියදම්, ඒ කාලය තුළ දී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

5. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2019 මුල් මාස හතරක කාල සීමාව අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය. තවද එම කාලය අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් VIII වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය.

2019 මුල් මාස හතර තුළදී 3 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල්වලින් අත්තිකාරම් ගෙවීම.

6. 2019 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තුළ යම් අවස්ථාවක මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන්, සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යයි ආණ්ඩුකාරවරයා සළකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්ථය එම උපලේඛනයේ පස්වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්ම විය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, මා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

වැඩසටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩසටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය.

7. (1) මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකර ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම් වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකිය.

(2) මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන්කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක්ම කළ හැකිය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු වියහැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල තවරදුරටත් අවශ්‍ය නොවන බවට ආණ්ඩුකාරවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත්කර ගැනීම, ආණ්ඩුකාරවරයා විසින් කරනු ලැබිය හැකිය.

මේ නියෝග යෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට ආණ්ඩුකාරවරයාට ඇති බලය.

9. ආණ්ඩුකාරවරයා විසින් -

*(අ)* මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ V වන තීරයෙහි, VII වන තීරයෙහි සහ VIII තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්,

*(ආ)* මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ VI වන තීරයෙහි දැක්වෙන අවම සීමා ;

නියමයන් මගින් 2020 මැයි මස 31 දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ආණ්ඩුකාරවරයා විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතුය.

10. ආණ්ඩුකාරවරයා විසින්, ලිඛිත නියෝගයක් මගින්, මේ නියෝගයෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන්, සහ :-

*(අ)* එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,
*(ආ)* එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

11. මෙම අවසරය සබරගමුව පළාතේ හත් (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ මාස තුන (03) ක කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2019 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

01-374

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.